## ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2016

---------------------------------------------

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ 51(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය

තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

රජයෙන් හා වෙනත් ව්‍යාපෘතිවලින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන යොදා ගනිමින් රු.655,908,762 කට මිලදීගත් ස්ථාවර වත්කම් වාර්ෂිකව ක්ෂය කරන නමුත් එම ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රම ක්ෂය කර ගිණුම්වලට ගැනීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන නොතිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 53 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක අගයන් දක්වා නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයෙහි 47 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ අයිතම වල සාධාරණ වටිනාකම සැලකිය යුතු තරමේ වෙනස්වීම් වන විට ප්‍රත්‍යාගණනයක් කළ යුතු වුවද ගිණුම්වල දැක්වෙන ශුද්ධ වටිනාකම රු.358,189,699 ක් වූ ආයතනයේ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද ප්‍රමිතයෙහි 21 ඡේදයට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී කරන ලද වාහන අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා දරන ලද රු. 913,446 ක වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල සේවක අර්ථ සාධක අරමුදල් වටිනාකම රු.1,895,481 ක් වුවද එය රු. 10,713,512 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය හා උපචිත වියදම් යටතේ වූ සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය රු. 8,818,031 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත පස් මහල් දේශන ශාලා ගොඩනැගිල්ලේ ඇස්තමේන්තු සැකසීම සහ පස් පරීක්ෂාව සඳහා ගෙවන ලද එකතුව රු.6,457,682 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) තංගල්ල විද්‍යාලයේ ඉදිකිරීමට යෝජිත වැඩහල් හා දේශන ශාලා ගොඩනැගිලි සඳහා ගෙවන ලද සියයට 30 ක අත්තිකාරම් මුදල වූ රු. 3,693,591 ක අත්තිකාරම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ඉකුත් වර්ෂ ගැලපුම් වටිනාකම රු. 342,280 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන ගැලපුම් යටතේ බදු පෙර අලාභයට ගලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගිණුම්වල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය වියදම් පරිභෝජනය රු. 5,082,605 ක් වුවද එය රු.4,360,436 ක් ලෙස දැක්වීම හේතුවෙන් ලිපි ද්‍රව්‍ය වියදම රු. 722,169 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු පාඨමාලා ගාස්තු හා ශිෂ්‍ය නේවාසික ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඍ) මුල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් යටතේ 2011 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් රු. 85,433 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමට පෙර දීර්ඝ කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණු එකතුව රු. 4,953,511 ක්වූ ලැබිය යුතු තැන්පතු සහ අත්තිකාරම් එකතුව රු. 2,009,844 ක් වූ රඳවා ගැනීම්වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු උපාධි පාඨමාලා ගාස්තු රු.15,754,623 කින් 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව රු.5,913,500 ක් ඉදිරියට ගෙන එමින් පැවතුනු අතර එම මුදල් අයකර ගැනීමකින් තොරව ශිෂ්‍යයන්ට උපාධි සහතික ලබාදී තිබුණු බැවින් එම මුදල් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. තවද වර්ෂ 2009/2010 සිට වර්ෂ 2015/2016 දක්වා උපාධි හා අනෙකුත් පාඨමාලා වලින් අයවිය යුතු රු.9,841,123 ක් වූ පාඨමාලා ගාස්තු ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිසුන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව ඉදිරියට ගෙන එමින් පැවතුනු ශිෂ්‍ය නේවාසික ගාස්තු රු.798,671 ක් නේවාසික සිසුන් පිටව ගොස් බොහෝ කල්ගතවී තිබුණු බැවින්ද, සුනාමි ණය ලෙස අයවිය යුතු රු. 191,464 ක් එම ණය ලබාගත් නිලධාරීන් දැනට සේවයේ නොසිටින බැවින්ද, අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණු බවට විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) පසුගිය වර්ෂය හා ඊට පෙර වර්ෂවලින් ඉදිරියට ගෙන එන ලද වටිනාකම රු.11,210,663 ක් වූ උපචිත වියදම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------

පහත සඳහන් නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2014 සැප්තැම්බර් 07 දිනැති අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ, 10(1),13(1),18,24(1),28 වගන්ති | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කුලපතිවරයෙකු හා පීඨාධිපතිවරු පත් කර නොතිබුණු අතර බලමණ්ඩල, ශාස්ත්‍රීය සභාව හා මණ්ඩප පිහිටුවීමටද කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) VIII පරිච්ඡේදයේ 6.1වගන්තිය | මාසික ඒකාබද්ධ වැටුප පදනම් කර ගෙන අතිකාල දීමනාව හා නිවාඩු දින වැටුප් ගණනය කළ යුතු වුවත්, දළ වැටුප පදනම් කර ගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ii) XV පරිච්ඡේදයේ 5.1 හා 10.1 වගන්ති | තංගල්ල විද්‍යාලයේ සේවයේ නියුතු කථිකාචාර්ය තනතුරක් දරන නිලධාරිනියක් 2016 පෙබරවාරි 23 දින සිට 2019 පෙබරවාරි 28 දින දක්වා විදේශ ශිෂ්‍යත්වයක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර නොගෙන හා ඇප බැඳුම්කර හා ගිවිසුම්වලට එළඹීමකින් තොරව දිවයිනෙන් බැහැර ගොස් තිබුණු අතර එම නිලධාරිනිය වෙනුවෙන් 2016 මාර්තු හා අප්‍රේල් මාසවලට අදාලව වැටුප් වශයෙන් රු. 125,870 ක් ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 394 | 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින අවලංගු කළ එකතුව රු. 697,854 ක්වූ චෙක්පත් 55 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 835(1),(2),(3) | (i) ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි 03 ක් වෙනුවෙන් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව මූලික තැන්පතු ලෙස රු.1,650,000ක් බදුකරුවන්ට ගෙවා තිබුණි.<br><br>(ii) මූලික තැන්පතු මුදල් ගෙවීමට අදාල කොන්දේසි ඇටෝර්නි ජනරාල්වරයා විමසා උපදෙස් ලබාගෙන ගිවිසුම් වලට ඇතුලත් කළ යුතු බව දක්වා ඇතත් ඉහත ගොඩනැගිලි බද්දට ගන්නා අවස්ථාවේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද එම ගොඩනැගිලිවල ඇති භාණ්ඩ හා සවිකිරීම් පිළිබඳ ලැයිස්තු බදු ගිවිසුම්වලට ඇතුලත් කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛ | ශුද්ධ වටිනාකම රු.437,451,967 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණු අතර පිරිවැය රු.31,211,626 ක්වූ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන්ද චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) 2011 අප්‍රේල් 28 දිනැති අංක 955 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී වැටුප් සමඟ ගෙවනු ලබන අධ්‍යයන දීමනාව අදාල කර නොගත යුතු වුවද විශ්වවිද්‍යාලය ඊට පටහැනිව කටයුතු කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.81,951,775 ක ඌනතාවයක් වු අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.47,358,479 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 34,593,296 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන හා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙන් ලැබුණු ප්‍රදාන රු.41,425,816 කින් වැඩිවී තිබුණද වෙනත් ආදායම් රු. 27,179,867 කින් අඩුවීම හා පිළිවෙලින් වැටුප්, ක්ෂය සහ දුරකථන, විදුලිය, ජලය, සනීපාරක්ෂක වැනි ගිවිසුම්ගත සේවා වියදම් රු.24,926,636 ක්, රු.11,566,163 ක් හා රු. 10,008,622 කින් වැඩිවීම මීට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 4 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අරමුණු පහත පරිදි වේ.

- ධිවර, සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.
- යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාල වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම හා ධිවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාල දැනුම ව්‍යාපෘත කිරීම.
- විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා ධිවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය තාක්ෂණික පාඨමාලා සැපයීම.
- ධීවර, සාගර විද්‍යාත්මක, තාක්ෂණික සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබාගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය හා හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණු වීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩිදියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

(අ) ඉහත සඳහන් අරමුණුවලින් විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය තාක්ෂණික පාඨමාලා සැපයීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමුකර නොතිබුණි.

**(ආ) සිසුන් බඳවා ගැනීම හා පාඨමාලා පැවැත්වීම**

---

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 97 ක් පැවැත්වීමටත් ඒ සඳහා සිසුන් 2,360 ක් සහභාගී කර ගැනීමටත් සැලසුම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සඳහා විද්‍යාල 08 හි බඳවා ගැනීමට අපේක්ෂිත සමස්ත සිසුන් සංඛ්‍යාව 1,565 ක් වුවත් සමාලෝචිත වර්ෂය තුල බඳවා ගෙන තිබුණේ සිසුන් 596 ක් පමණක් වූ බැවින් සමස්ත සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 38 ක් විය. ඉන් ත්‍රිකුණාමලය විද්‍යාලය හැර අනෙකුත් විද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණු අතර මට්ටක්කුලිය හා කළුතර විද්‍යාල දෙකෙහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 21 ක් තරම්වූ ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ii) ත්‍රිකුණාමලය හැර අනෙකුත් විද්‍යාල 07 ක ඩිප්ලෝමා පාඨමාලා 04 ක් පැවැත්වීම සඳහා සිසුන් 225 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, මට්ටක්කුලිය හා මීගමුව විද්‍යාල වෙනුවෙන් සිසුන් 37 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. ඉතිරි විද්‍යාල 05 හි එකම ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පවත්වා නොතිබුණි.

(iii) විද්‍යාල 08 හි සහතික පත්‍ර පාඨමාලා 15 ක් පැවැත්වීමට හා සිසුන් 1,165 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද, ඒ සඳහා බඳවා ගැනීමට හැකිවී තිබුණේ සිසුන් 403 ක් පමණි. ඒ අනුව සහතික පත්‍ර පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට ***35*** ක් විය.

(iv) ජංගම පුහුණු වැඩසටහන් 06 ක් හා වෙනත් පුහුණු වැඩසටහන් 05ක් විද්‍යාල 06 ක පැවැත්වීමට හා ඒ සඳහා සිසුන් 815 දෙනෙකු සහභාගි කරවා ගැනීමට සැලසුම් කර තිබුණද කිසිඳු විද්‍යාලයක එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේවෙතත් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත්ව නොතිබුණු වෙනත් පුහුණු වැඩසටහන් 04 ක් විද්‍යාල 07 ක පවත්වා තිබුණු අතර ඒ සඳහා සිසුන් 500 දෙනෙකු සහභාගි කරවා ගෙන තිබුණි.

(v) උපාධි පාඨමාලා සඳහා සිසුන් 175 ක් බඳවා ගැනීමට ඉඩපහසුකම් පැවතියද සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා සිසුන් 156 ක් බඳවා ගෙන තිබුණු අතර එම බඳවාගැනීම් පසුගිය වර්ෂය හා සැසඳීමේදී සිසුන් 69 දෙනෙකුගෙන් හෙවත් සියයට 44 ක වර්ධනයක් නිරීක්ෂණය විය.
ඉහත තොරතුරුවලට අනුව 2015 ජුනි 18 දින සිට ආරම්භ කරන ලද සාගර විශ්වවිද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ හා පාඨමාලා පැවැත්වීමේ ප්‍රමාණවත් ප්‍රගතියක් 2016 වර්ෂය අවසන් වන විට ලබා කරගෙන නොතිබුණි.

(vi) විශ්වවිද්‍යාලයට අයත් ප්‍රාදේශීය විද්‍යාල 8 න් විද්‍යාල 02ක පමණක් NVQ විභාග පවත්වා තිබුණු අතර වර්ෂය තුල NVQ සහතික 30 ක් පමණක් නිකුත් කර තිබුණි.

(vii) ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය තුල මට්ටක්කුලිය විද්‍යාලයේ උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද සිසුන් 114 දෙනෙකුගෙන් සිසුන් 39 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබුණි.

**(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) තත්ත්ව සහතික ලබා ගැනීම**

විද්‍යාල 04 ක පාඨමාලා 04 ක් සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ **(ISO)** තත්ත්ව සහතික ලබා ගැනීම සඳහා උපදේශක සේවා ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ රු.2,500,000 කට 2012 දෙසැම්බර් 21 දින ගිවිසුමකට එළඹී තිබුණු අතර ඒ සඳහා

සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,207,500 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2018 මාර්තු මාසය අවසාන වන විටත් යාපනය හා මීගමුව විද්‍යාල සඳහා (ISO) තත්ත්ව සහතික ලබා ගෙන තිබුණි. තවද, ගිවිසුම්ගත උපදේශන සේවාව සැපයීම නිමකළ යුතු දිනය පිළිබඳ ගිවිසුමේ කොන්දේසිවලට ඇතුළත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මට්ටක්කුලිය ශිෂ්‍ය නේවාසිකාගාරය 2015 මාර්තු 31 දින බදුකරුට ආපසු භාරදී තිබුණද 2017 නොවැම්බර් 30 දින වන විටත් රු. 840,000 ක් වූ මූලික තැන්පතු මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් පවරා ගන්නා ලද ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය ආරම්භයේ සිට පරිහරණය කරමින් පැවතුන ප්‍රධාන කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීයව පිහිටි විද්‍යාල 08 ක ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම්වල අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම, වැඩිදියුණු කිරීම හා මානව සම්පත් සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 81.69 ක් රජයෙන් ප්‍රදාන ලෙස ලබාදී තිබුණද ඉන් රු.මිලියන 52.14 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සැලසුම් කළ පරිදි රජයේ ප්‍රදාන උපයෝජනය කිරීමට කළමනාකරණය අපොහොසත් වීම හේතුවෙන් රු.මිලියන 29.55 ක් එනම් සියයට 36 ක් ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර, වැඩහල් හා පන්ති කාමර වල යටිතල පහසුකම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා ලබා දී තිබුණු රු.මිලියන 30 ක ප්‍රතිපාදන උපයෝජනය කර අදාල වැඩිදියුණු කිරීම් සිදු කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

## 4.4 හඳුනාගත් පාඩු

-----------------------

මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාලයේ පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සැකසීම හා පස් පරීක්ෂාව වෙනුවෙන් 2016 ජූලි මස රු.6,457,682 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා

ඉන්ජිනියරින් ඇන්ඩ් ලැබෝරට්රි සර්විසස් පෞද්ගලික සමාගමට ගෙවා තිබුණද 2018 පෙබරවාරි අවසන් වන විටත් අදාල ඉදිකිරීම් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.
ප්‍රතිපාදන නොලැබීම මත මෙම ඉදිකිරීම සිදු කිරීමට නොහැකිවී ඇති බව උපකුලපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු වාහන 29 න් වාහන 08 ක් දීර්ඝ කාලයක් තිස්සේ ගර්හිත තත්ත්වයේ පැවතුණු අතර එම වාහන සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 14 දින රු. මිලියන 1.6 කට මිලදී ගෙන තිබුණු නැව්වල පිටත සවිකරන එන්ජින් 02 ක් 2017 සැප්තැම්බර් 21 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණු අතර 2014 වර්ෂයේදී රු. මිලියන 2.5 කට මිලදී ගෙන තිබුණු ලේත් මැෂින් 02 ක්ද ස්ථානගතකර විදුලි සම්බන්ධතාවය ලබාදී නොතිබීම හේතුවෙන් පුහුණු කටයුතු සඳහා යොදාගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 327 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 199 ක් වූයෙන් පුරප්පාඩු 128 ක් පැවතුණි.

(ආ) ආයතනයේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සඳහා ස්ථිරව නිලධාරීන් බඳවාගැනීමට කටයුතු නොකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් හා තාවකාලික පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවාගෙන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 3,006,866 ක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 විශ්වවිද්‍යාලය පිහිටුවීම**

2014 සැප්තැම්බර් 07 දිනැති අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ අංක 01 හා 71 වගන්ති ප්‍රකාරව අදාල අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද දිනය වූ 2015 ජුනි 17 දින 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත අවසන් වී එම ආයතනයේ පැවති සියලු නිශ්චල හා චංචල දේපල ද එදිනට වූ බැරකම් ද පවරාගෙන 2015 ජුනි 18 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී.

## 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම් ඉදිරිපත් කරන ලද්දේ 2018 ජනවාරි 25 දිනදීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගනුදෙනු හා ජර්නල් සටහන් ලෙජර් ගිණුම්වල සටහන් කිරීමේදී අඩුපාඩු සිදුවී තිබීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | වත්කම් නීත්‍යානුකූලව පවරා නොගැනීම හා වත්කම් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඇ) කාර්යමණ්ඩල පරිපාලනය | කාර්යමණ්ඩල නියමිත පරිදි අන්තර්ග්‍රහණය නොකිරීම හා පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සැලසුම්කළ පරිදි පාඨමාලා පැවැත්වීමට නොහැකිවීම. |
| (ඈ) නේවාසිකාගාර පාලනය | (i) නේවාසිකාගාර උපපාලක තනතුරට නිලධාරියකු පත් නොකිරීම හා සිසුන්ට නේවාසිකාගාර ලබා දීමට පෙර එහි නීතිරීති සම්බන්ධයෙන් සිසුන් දැනුවත් නොකිරීම.<br>(ii) සිසුන් නේවාසිකාගාරවලට ඇතුලත් කිරීම හා ඉවත්ව යාම පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට ලේඛනයක් පවත්වා නොතිබීම. |